දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 38 /2014

මගේ අංක :- කේ 06/විවිධ/චක්‍රලේඛ/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.09. 11 වන දින.

**<u>සමා අනුමැතියෙන් පසු සිර ගොනුවල ඇතුලත් තොරතුරු ලේඛණ ගතකිරීම.</u>**

උක්ත කරුණට අදාලව 2014.08.12 වන දින පුණරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පැවති සාකච්ඡාවේදී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු බව අමාත්‍ය තුමා මා හට නියෝග කරන ලදී.

01). සිරගොණු සමා අනුමැතියෙන් පසු ඔබ ආයතනයට ලද විගස එසේ අනුමැතිය ලද සිරගොණු වල අඩංගු දත්තයන් (තොරතුරු) සියල්ල ඔබ විසින් ලේඛණ ගතකල යුතුය. මීට අමතරව සිරකරුවන් නිදහස් කිරීමෙන් පසු අදාල සියළු සිරගොණු ලේඛණාගාරයට භාරදියයුතු අතර, සමා අනුමැතිය ලද සිරගොණු වල අඩංගු විස්තර ඇතුලත් ලේඛණ සියල්ල අවශ්‍ය විටෙක තොරතුරු ලබාගැනිම සඳහා ලියාපදිංචි ලිපිකරු අංශයේ හෝ විනය අංශයේ සුරක්ෂිතව තිබිය යුතුය.

02). සිරකරුවන් නිදහස්වී වසර 05 කාලයක් ඉක්මවූ සිරගොණු විනාශකිරීමට ඔබ විසින් කටයුතු කරන්නේ නම් එසේ කලයුත්තේ 1984.08.31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයෙහි හා 1973 අංක 48 දරණ ලේඛනාරක්‍ෂක පනතේ 16 (1) "අ" සහ " ආ" යන ඡේදයන් යටතේ වන නියෝගයන් පරිදිවේ.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.